දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NA/03/SG (HS) PRO/01/2023 (1) වෙළම
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )2024.03. 25
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

අදාළ සියලුදෙනාගේ දැනගැනීම පිණිස.

**විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් කිරීම - 2023.**

1 වෙනි ශ්‍රේණියේ/අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරේ සේවය කරන නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබූ අංක 02-112/2023 හා 2023.08.04 දිනැති පොදු චක්‍රලේඛ ලිපිය හා අංක 02-27/2024 හා 2024.02.20 දිනැති සංශෝධිත පොදු චක්‍රලේඛ ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, නිලධාරීන් 376 ක ප්‍රමාණයක් විසින් යොමුකර ඇති අයදුම්පත් අනුව, පශ්චාද් ප්‍රාථමික හෙද විද්‍යාලේ වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය (මාස 12) වින්නඹු කර්මය/මානසික හෙදකම (මාස 06) අඩංගු ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් පරීක්ෂණයේ දී ලබාගත් කුසලතාව, හා 1 වෙනි ශ්‍රේණියේ/අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් වූ දිනය හා එම තනතුරේ වැඩභාරගත් දිනය අනුව සලකා සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනය ඇමුණුම් අංක 01 මගින් දක්වා ඇත.

03. එහිදී ඒ ඒ වර්ෂවලට අදාළව අධ්‍යයන පුහුණු හා පර්යේෂණ අංශය මගින් නිකුත් කර ඇති සියලු විභාග ප්‍රතිඵල ලේඛන පරීක්ෂා කර කුසලතාව දක්වා ඇති අතර, ඇමුණුම් අංක 01 මගින් දක්වා ඇති ලේඛනයේ දැක්වෙන ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් යම් ගැටලුවක්, විරෝධතාවක් හෝ නිවැරදි කිරීමක් වේ නම් **011-2681034** යන ෆැක්ස් අංකය මගින් හෝ nursingbranch1@gmail.com යන විද්‍යුත් තැපැල මගින් **2024.04.02** දිනට පෙර මා වෙත යොමු කර, **අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත, කොළඹ 10** යන ලිපිනයට **2024.04.05** දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීමට කටයුතු කරන මෙන් දන්වමි.

04. තව ද මෙම ලේඛනය උක්ත තනතුරට උසස් කිරීමට අදාළව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අවසන් ජ්‍යෙෂ්ඨතා ලේඛනය නොවන බව දන්වන අතර, ඉහත පරිදි ලැබෙන විරෝධතා හා නිවැරදි කිරීම් සලකා බලා ඒ අනුව, සංශෝධනය සිදුවිය හැකි බව කාරුණිකව දන්වමි.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

දුරකථන අංකය - 011- 2693753
ෆැක්ස් අංකය - 011 - 2681034
විද්‍යුත් තැපැල - diradmin1@health.gov.lk